*සැ. යු.*-2015.04.02 දින පළවූ අංක 1,909 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,910 - 2015 අප්‍රේල් මස 10 වැනි සිකුරාදා - 2015.04.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 491 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අප්‍රේල් මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අප්‍රේල් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

489- B 80936—5,302 (2015/04)
B1-

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2015

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පන්තියේ පුරප්පාඩු 4431 ක් සඳහා බඳවා ගැනීම පිණිස පවත්වනු ලබන සීමිත තරග විභාගය වෙනුවෙන් මෙම නිවේදනයට අදාළව අයදුම්පත් භාරගනු ලැබේ. සියලු සුදුසුකම් 2015.01.01 දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.

මෙම නිවේදනයේ "සේවය" යන පදයෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයයි. "ව්‍යවස්ථා සංග්‍රහය" යනුවෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයයි.

02. මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ (අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ හෝ විදුහල්පතිගේ) නිර්දේශ සහිතව ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ'' යන ලිපිනයට 2015.05.11 වැනි දිනට හෝ එදිනට පෙර හෝ ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වැනි පන්තියට බඳවා ගැනීම සඳහාවන සීමිත තරග විභාගය 2015" යන්න සඳහන් කළ යුතු ය.

03. *විභාග දිනය හා නගර* :

(i) මෙම විභාගය 2015 ජූලි මාසයේ දී පැවැත්වේ. විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය සතුව ඇත.

(ii) පහත සඳහන් ප්‍රධාන නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී විභාගය පවත්වනු ලැබේ. විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් ඔවුන් ඊට යාබද නගරයේ විභාග මධ්‍යස්ථානයට යොමු කරනු ලැබේ.

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| කුරුණෑගල | 10 |
| පුත්තලම | 11 |
| අනුරාධපුරය | 12 |
| පොළොන්නරුව | 13 |
| බදුල්ල | 14 |
| මොණරාගල | 15 |
| රත්නපුර | 16 |
| කෑගල්ල | 17 |
| අම්පාර | 18 |
| මඩකලපුව | 19 |
| ත්‍රිකුණාමලය | 20 |
| යාපනය | 21 |
| මුලතිව් | 22 |
| මන්නාරම | 23 |
| කිලිනොච්චිය | 24 |
| වව්නියාව | 25 |

ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන විභාග මධ්‍යස්ථානයක් අවලංගු කිරීමට විභාග කොමසාරිස් ජනරාල්ට බලය තිබේ.

04. *සේවා කොන්දේසි* :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/31 සහ 2014.10.22 වැනි දින දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි ද, එම ව්‍යවස්ථා සංග්‍රහයට මින් මතු කෙරෙන සංශෝධනවලට ද රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු 3 වන පන්තියට පත් කරනු ලැබේ.

05. *වැටුප් පරිමාණය* : ජී. ඊ. - 4-2006

රු. 17,060-7x330-6x400-11x645-14x790-රු.39,925

06. *සුදුසුකම්* :

(අ) පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති සේවය ස්ථිර කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වැනි පන්තියට පත් කිරීම සඳහා වන සීමිත තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

(1) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් අධ්‍යාපනවේදී උපාධිය,

*හෝ*

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම විෂයය ක්ෂේත්‍රයක උපාධිය
සමඟ
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව;
හෝ
ගුරු පුහුණු සහතිකය;
හෝ

(iii) ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව/ගුරු පුහුණු සහතිකය ලබා තිබීම.

(2) පළපුරුද්ද :

(අ) ඉහත (i) හෝ (ii) සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක්;

හෝ

(ආ) ඉහත (iii) සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර හයක (06) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියකු වීම හා එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

(3) *කායික හා මානසික යෝග්‍යතාවය :*

සෑම අපේක්ෂකයකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යාවයකින් යුක්ත විය යුතු ය.

*සටහන :* අයදුම්පත් කැඳවන දිනට ඉහත සඳහන් පූර්වාසන්න සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන නැත්තාවූ ද, මෙම කාලය තුළ කරන ලද වරදකට කිසියම් දඬුවමක් (අවවාද කිරීමක් හැර) ලබා ඇත්තාවූ ද නිලධාරියෙක්/නිලධාරිනියක් මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් නොලබයි.

(ආ) *වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය;
(ii) විදුහල්පති සේවයට බඳවා ගැනීම සඳහා පවත්වන තරග විභාගය සඳහා තුන් (03) වතාවකට වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයකුට අවසර නැත;
(iii) විදුහල්පති සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් *ගැසට්* නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය;
(iv) ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථිර කර තිබිය යුතු ය.

(ඇ) *වයස :*

(i) උපරිම වයස අවුරුදු 50 විය යුතු ය.

07. විභාග ගාස්තු රුපියල් හත්සියයකි. (රු. 700.00) විභාග ගාස්තුව ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.

08. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට යාකොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කරමින් "8 1/2 x 12" ප්‍රමාණයේ කඩදාසියක සකසා අපේක්ෂකයාගේ අත් අකුරින් පුරවා එවිය යුතු ය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය. (අංක 01 සිට 06 දක්වා මුල් පිටුවේ ද, ඉතිරි කොටස් ඊළග පිටුවල ද දක්වන්න.);

(ආ) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති මාධ්‍ය භාෂාවෙන්ම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ;

(ඇ) ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර හා සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. ඉල්ලුම්පත්‍රයක් තැපෑලේ දී නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ;

(ඈ) ඉල්ලුම්පත්‍ර ලැබුණු බව ඉල්ලුම්කරුවන් වෙත දන්වා නොයවන අතර, විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

09. *විභාගයට පෙනී සිටීම :*

(අ) නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ;

(ආ) අපේක්ෂක/අපේක්ෂිකාවක තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, විභාගයේ පළමුවන ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අවස්ථාවේදීම තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට භාර දිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ මුල පළ කර ඇත.

*සටහන :* අපේක්ෂක/අපේක්ෂිකාවක වෙත විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය තනතුරට පත්කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

10. අනන්‍යතාවය :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂක/අපේක්ෂිකාවක්ම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

11. සාවද්‍ය තොරතුරු සැපයීම :

අපේක්ෂක/අපේක්ෂිකාවකට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂක/අපේක්ෂිකාවක විසින් කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කරනු ලැබ ඇති බව සනාථ වුවහොත් හෝ එසේ නැතහොත් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කරනු ලැබ ඇති බව හෙළිදරව් වුවහොත් ඔහු /ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. විභාග මාධ්‍ය :

(අ) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂක/අපේක්ෂිකාව විභාගයට පෙනී සිටිය යුතු වන්නේ තමා රජයේ සේවයට ඇතුළත් වීම පිණිස සුදුසුකම් ලැබූ විභාගය හෝ සම්මුඛ පරීක්ෂණය හෝ සමත් වූ මාධ්‍ය භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ පමණි.

සටහන :

(i) අපේක්ෂක/අපේක්ෂිකාවක විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම තමා විසින් ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යයෙන් පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(ii) ඉල්ලුම්පතේ සඳහන් විභාග භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අපේක්ෂක/අපේක්ෂිකාවකට අවසර දෙනු නොලැබේ.

13. බඳවා ගැනීමේ ක්‍රමය :

පහත සඳහන් විෂයයන් පිළිබඳව ලිඛිත ප්‍රශ්න පත්‍රවලින් සමන්විත තරග විභාගයක ඉහළ ලකුණු ලැබූ අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා එයින් සුදුසුකම් ලබන්නන් ව්‍යුහගත පරීක්ෂණයකට කැඳවනු ඇත. සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත්කරනු ලබන්නේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පරිදි අධ්‍යාපන විෂයය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසිනි.

(අ) *ලිඛිත පරීක්ෂණය.*—ප්‍රශ්න පත්‍ර 03කින් යුත් ලිඛිත විභාගයකි.

(i) අවබෝධය - ලකුණු 100 - පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයකි.

(ii) පාසල් පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය - ලකුණු 100 - පැය 02 ක ප්‍රශ්න පත්‍රයකි.

(iii) අභියෝග්‍යතාව හා සාමාන්‍ය දැනීම - ලකුණු 100 - පැය 1 1/2ක ප්‍රශ්න පත්‍රයකි.

සෑම විෂයක්ම සමත්වීම සඳහා එක් එක් විෂයට අවම වශයෙන් ලකුණු 40%ක් ලබා ගත යුතුය.

13.1 විෂය නිර්දේශය :

(i) *අවබෝධය.*—පාඨ කිහිපයක අර්ථය වටහා ගැනීමට අපේක්ෂකයා සතු ශක්තිය මැන ගැනීම සඳහා සහ සාරාංශගත කිරීම පිළිබඳ අවබෝධය මැන බැලීම සඳහා ප්‍රශ්න සකස් කරනු ලැබේ.

(ii) *පාසල් පරිපාලනය පිළිබඳ සිද්ධි අධ්‍යයනය.*—පාසල් හා කළමනාකරණය තුළ ඇති විය හැකි සිද්ධි කිහිපයක් ඉදිරිපත් කර, එම සිද්ධිවලට ප්‍රතිචාර දැක්වීම හා ගැටලු නිරාකරණය පිළිබඳව අපේක්ෂකයින්ගේ අදහස් මතු කර ගැනීම අරමුණු කරගත් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ.

(iii) *අභියෝග්‍යතාව හා සාමාන්‍ය දැනීම.*—ජාතික, කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසර තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික, භූගෝලීය හා අනෙකුත් අදාළ සාධක සම්බන්ධව අපේක්ෂකයා සතු දැනුවත්භාවය සහ අවබෝධය හා පදගත, සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනය සහ ප්‍රතිචාරය පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

(ආ) සම්මුඛ පරීක්ෂණය :

(i) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය-

ලිඛිත පරීක්ෂණයට ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව පදනම්ව ඉහළම ලකුණු ලැබූ අනුපිළිවෙල පදනම්ව තෝරාගනු ලැබූ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වූ අපේක්ෂක සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙහි දී බඳවා ගැනීමේ *ගැසට් නිවේදනය* ප්‍රකාරව මූලික සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කරනු ලැබේ. එයින් සුදුසුකම් ලබන්නන් ව්‍යුහගත පරීක්ෂණයට කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

(ii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

විදුහල්පති කාර්යභාරයට අදාළ මාතෘකාවක් ඔස්සේ ඉදිරිපත් කිරීමක් කළ යුතු ය. ඒ සඳහා ලකුණු 25ක් ලබා දෙනු ලැබේ.

ඉදිරිපත් කිරීම සඳහා ලකුණු ලබාදීමේ නිර්ණායක

| | |
|---|---|
| 1. හැඳින්වීම | - ලකුණු 04 |
| 2. ඉදිරිපත් කිරීමේ සැලැස්ම | - ලකුණු 04 |
| 3. ඉදිරිපත් කිරීමේ කුසලතාව | - ලකුණු 08 |
| 4. විෂයය දැනුම | - ලකුණු 05 |
| 5. කාල කළමනාකරණය | - ලකුණු 04 |

* ලිඛිත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ සඳහා ලබාගත් ලකුණුවල එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අනුපිළිවෙලට පුරප්පාඩු පුරවනු ලැබේ.

13.2 ප්‍රතිඵල නිකුත් කිරීම :

ගැසට් නිවේදනයේ 13(අ) ලිඛිත පරීක්‍ෂණයේ දී හා 13 (ආ) (ii) ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, වෙත ලබාදෙනු ඇත. අනතුරුව විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ wwww.results. exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

14. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

14.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය. එක් අවුරුද්දක වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

14.2 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 12.1 හා 12.6 සිට 12.12 වගන්ති ද කොමිෂන් සභා කාර්ය පටිපාටි රීති ද අදාළ වේ.

14.3 විදුහල්පති සේවයේ 3 පන්තියට පත්වී වසර 03කට පෙර පළමු කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය සමත්විය යුතුය.

14.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතා මට්ටම් පත්විමේ දින සිට වසර 05ක් ඇතුළත ලබා ගත යුතුවේ. සන්ධාන භාෂාව වන ඉංග්‍රිසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය සෑම නිලධාරියෙකුම බඳවා ගැනීමේ දින සිට වසර තුන (03) ක් ඇතුළත ලබාගත යුතු ය. නිලධාරියෙකු අ. පො. ස. (සා. පෙළ.) විභාගයේ දී ඉංග්‍රිසි විෂයය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබේ නම් ඉංග්‍රිසි භාෂා පරීක්‍ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරින් ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වු ඉංග්‍රීසි භාෂා පරීක්‍ෂණයට පෙනී සිට අවම වශයෙන් 40%ක් ලකුණු ලබා ගත යුතුය.

14.5 ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම් ලිපිය භාර ගත්ත ද ඒ අනුව ලබාදෙන ස්ථානගත කිරීම අනුව රාජකාරි භාර නොගන්නේ නම් එම පත්වීම අවලංගු කරන අතර, සුදුසුකම් ලැබු ප්‍රමුඛතා ලේඛණයේ ඊළග සුදුසුකම් ලාභියා ඒ සඳහා පත්කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව හා පුරප්පාඩු පිරවීම සම්බන්ධව ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තිරණය කරනු ඇත.

සිංහල, දෙමළ හා ඉංග්‍රිසි භාෂාවලින් පළ කරන මෙම ගැසට් නිවේදනයේ භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

උපාලි මාරසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2015 අප්‍රේල් මස 10 වැනි දින.

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ආදර්ශ අයදුම්පත්‍රය

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වැනි පන්තියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2015

Specimen Application
The Competitive Examination for the Recruitment to the Class 3 of the Sri L anka Principals' Service - 2015

01. (i) විභාගය සඳහා ඉල්ලුම් කරන මාධ්‍යය :

සිංහල -2
දෙමළ -3
ඉංග්‍රීසි -4

(ii)

| ඉල්ලුම් කරන නගරය | නගර අංකය |
|---|---|
| (i) | |
| (ii) | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

02. (i) සම්පුර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA )

(ii) අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් මුලකුරු පසුව ද යොදා නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා. : GUNAWARDHANA, H. M. S. K.)

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. (i) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ii) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
(iii) රාජකාරි ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය
පුරුෂ - 0
ස්ත්‍රි -1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05.ජාතික හැඳුනුම්පත් අංකය

06. (i) උපන් දිනය : වර්ෂය මාසය දිනය

(ii) 2015.01.01 වැනි දිනට වයස

අවුරුදු මාස දින

07. (i) ගුරුවරයෙකු වශයෙන් මුලින්ම රජයේ සේවයට පත්වු දිනය :————.
(ii) සේවය ස්ථිර කරන ලද දිනය :————.
(iii) සේවා ස්ථානය :————.
(iv) 2015.01.01 වැනි දිනට සේවා කාලය

අවුරුදු මාස දින

08.අධ්‍යාපන සුදුසුකම් :

| අධ්‍යාපන සුදුසුකම් | සමත් වූ වර්ෂය | ලබාගත් ආයතනය | සහතිකය වලංගු වන දිනය |
|---|---|---|---|
| අධ්‍යාපනවේදී උපාධිය | | | |
| උපාධිය (ක්ෂේත්‍රය : ......) | | | |
| පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව | | | |
| ගුරු පුහුණු සහතිකය | | | |
| ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව | | | |

* ගැසට් පත්‍රයේ 06 (1) ට අදාළව අයදුම්කිරීමට සුදුසුකම් ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ තොරතුරු පමණක් මෙහි ඇතුළත් කරන්න.

09. ඔබ රජයේ සේවයට ඇතුළු වීම සඳහා සුදුසුකම් ලැබූ විභාගය සමත් වූ භාෂා මාධ්‍යය :————.

10. මුදල් කුවිතාන්සිය (ලදුපත) මනා ලෙස අලවන්න. :

| |
|---|
| මුදල් කුවිතාන්සියේ එක් දාරයකින් නොගැලවෙන පරිදි මෙහි අලවන්න. |

11. අයදුම්කරුගේ සහතිකය :

2015.01.01 දිනට පූර්වාසන්න වූ පස් අවුරුදු/සය අවුරුදු කාලය තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය හෝ පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධික හැර) වේතනාධික සියල්ලම මා විසින් උපයාගෙන ඇති බවත්, (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත්, මම ප්‍රකාශ කරමි. සීමිත තරග විභාගයට පෙනී සිටිමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තුව ගෙවන ලද අංක ............ හා ............ දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග පිළිබඳ නීති රීතිවලට එකගව ක්‍රියා කිරීමටත්, එම විභාගය පිළිබඳ ව්‍යවස්ථා අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවතිද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකග වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12. විදුහල්පතිගේ සහතිකය :

...... .................. (නම) වන මෙම අයදුම්කරු/අයදුම්කාරිය ............ දින සිට මෙම පාසලේ සේවය කරන බවත් ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම ඉල්ලුම්පත්‍රය අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
විදුහල්පතිගේ අත්සන
(නිලමුද්‍රාව තබන්න)

නම :————.

සේවා ස්ථානය :————.

දිනය :————.

13. අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/විදුහල්පතිගේ සහතිකය :

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන .......................... (නම) ස්වාමීන් වහන්සේ/පියතුමා/කන්‍යා සොයුරිය/මහතා/මහත්මිය/මෙනවිය ............... කාර්යාලයේ/විද්‍යාලයේ සේවය කරන බවත්, 2015.01.01 වැනි දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු/සය අවුරුදු කාල සීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) ඔහු/ඇයගේ වේතනාධික සියල්ලම උපයාගෙන ඇති බවත්, එම කාල සීමාව තුළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය යටත් නොවූ බවත්, පෞද්ගලික ලිපිගොනු අනුව නිවැරදි බවද, අදාළ *ගැසට් නිවේදනයේ* සඳහන් රෙගුලාසි ප්‍රකාර ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටිමට සුදුසුකම් ලබා ඇති බව ද, මෙම ඉල්ලුම් පත්‍රයේ 01-11 දක්වා සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ බව ද මෙයින් සහතික කරමි.

————,
අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

නම :————.

පදවි නාමය :————.

සේවා ස්ථානය :————.

දිනය :————.

04-461

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.